www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුරෝපීය මැතිවරනයේ පාඩම්

**Lessons of the European elections**

**ජර්මානු සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශනය**
**2004 ජූලි 01**

ජූනි 13 දා පැවති යුරෝපීය මැතිවරනය නොවරදින පනිවිඩයක් නිකුත් කොට ඇත. එනම් යුරෝපීය සංගමය හා යුරෝපීය ආන්ඩු අනුගමනය කරන ප්‍රතිපත්ති ජනගහනයෙන් අතිමහත් බහුතරයක් විසින් ප්‍රතික්ෂේප කරන බවයි. මැතිවරන ප්‍රතිඵලය නිල යුරෝපීය දේශපාලනය සමන්විතවන්නා වූ විවෘත වෙලඳපොල ආර්ථික ප්‍රතිපත්තීන්ටත්, සුභසාධන කප්පාදුවට හා යුදවාදයටත් එරෙහි මහජන තීන්දුවකි.

එක් අතකින් මෙය ප්‍රකාශිත වනුයේ ඓතිහාසිකව ඉහල මට්ටමකට එනම් සියයට 56කට සේන්දු වී ඇති ඡන්දය ප්‍රතික්ෂේප කිරීමේ මට්ටමෙන් ය, අනෙක් අතට බොහෝ ඡන්ද දායකයින් බලයේ සිටින ආන්ඩුවලට දඬුවම් කිරීම සඳහා ඡන්දය භාවිතා කිරීමෙන් ය. ටෝනි බ්ලෙයාර්ගේ කම්කරු පක්ෂය, ගේහාර්ඩ් ශ්රෝඩර්ගේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය, ජැක් චිරාක් සහ ජීන් පියරේ රෆාරින්ගේ යූඑම්පීය, සිල්වියෝ බර්ලුස්කෝනිගේ ෆොසා ඉටලියා සිට පෝලන්තයේ පශ්චාත් ස්ටැලින්වාදී පක්ෂය යන සියල්ලෝම විනාශකාරී ප්‍රහාරයකට මුහුන දුන්හ.

මෙම පරාජයන්ගේ වාසිය ඩැහැ ගැනීමට අවස්ථා කිහිපයකදී දක්ෂිනාංශික ස්වෝත්තමවාදී පක්ෂයන්ට හැකි වූ නමුත් සමස්ත මැතිවරනය ම දක්ෂිනාංශයට බර වූ එකක් නොවින. මැතිවරන ප්‍රතිඵලය අංගලක්ෂිත වූයේ ඊනියා සමාජ ප්‍රතිසංස්කරනවලට ප්‍රබල විරුද්ධත්වයකින් ද විශේෂයෙන් ම එංගලන්තය හා ඉතාලිය සම්බන්ධයෙන් ඉරාක යුද්ධයට සහභාගි වීමට එරෙහිව බවට ද බොහෝ විශ්ලේශනයන් එකඟ විය. යුද්ධයට සහයෝගය දැක්වීමේ කාරනය මත මාස තුනකට ඉහත දී කොන්සවේටිව් ආන්ඩුව ඡන්දයෙන් පරාජය කල අතර ඡන්දදායකයෝ මෙම පාර්ලිමේන්තු මැතිවරනයේ දී ද මවිතකරවූ එම ප්‍රතිඵලයම ස්ථිර කලහ.

වසරකට පෙර, බුද්ධිමතුන් සැලකිය යුතු සංඛ්‍යාවක් විසින් සහාය පුදකල පුලුල්ව ප්‍රචාරය කෙරුනු ප්‍රකාශනයකින් ජර්මානු රජයේ දාර්ශනිකයෙකු වන ජර්ජන් හබර්මාස් නිවේදනය කරනු ලැබුවේ 2003 පෙබරවාරි 15 ''යුරෝපියානු මහජන විෂය පථයක උපත පිලිබඳ සංඥාවක් ලෙස ඉතිහාස පොත්වල ලේඛන ගත වනු ඇත'' යන්න යි. මෙ දින යුරෝපයේ අග නගරවල මිලියන සංඛ්‍යාත මහ ජනයා ඉරාක යුද්ධයට එරෙහිව පෙලපාලි දැක්වූහ. හබර්මාස් මෙම පෙලපාලි යුරෝපීය සංගමයට උපකාරක ඒවා යැයි සැලකී ය. ඔහු මෙසේ පැවසී ය. ''යුරෝපය 20වන ශත වර්ෂයේ අපර භාගයේ දී ගැටලු දෙකක් සඳහා ආදර්ශමත් විසඳුම් සොයාගෙන ඇත.'' ''පශ්චාත් ජාතික රාජ්‍ය පර්යායේ පරමාදර්ශයක් ලෙස කටයුතු කල හැකි, ජාතික රාජ්‍යයට ඉහලින් හා ඉන් ඔබ්බට යන පාලන රූපයක් යුරෝපීය සංගමය විසින් දැනට මත් හඳුන්වා දී ඇත.'' එමෙන්ම ''යුරෝපීය සුභ සාධන පද්ධතිය'', අනාගතයේ දී පවා පහලට නොවැටෙන, ''එක්තරා දුරකට ධනවාදය මෙල්ල කල හැකි ප්‍රමිතියක් සම්පාදනය කොට ඇත.''

2004 ජූනි 18 මැතිවරනය මගින් හබර්මාස් ස්ථාවරය නිෂ්ප්‍රභ කරනු ලැබ ඇත. ඔහුගේ ම වචනයෙන් කිව හොත්, එය පෙන්නුම් කලේ ''යුරෝපීය මහජන මතයක උපත'' සිද්ධවනුයේ යුරෝපීය සංගමයට පක්ෂව නොව ඊට එරෙහිව කැරලි ගැසීමක් ලෙස ය. ''යුරෝපීය සුභ සාධක පද්ධතිය'' ආරක්ෂා කිරීමත් යුද්ධයට හා යුදවාදයට ඇති විරෝධයත් ප්‍රකාශයට පත් වූයේ යුරෝපීය ආන්ඩු හා බ්‍රසල්ස්හි අධිකාරීන් පෘථුල වසයෙන් ප්‍රතික්ෂේප කිරීමත් ලෙසිනි.

මැතිවරන ප්‍රතිඵලයෙන් පෙන්නුම් කලේ නිල යුරෝපීය දේශපාලනය මහජනතාවගෙන් වෙන් කෙරෙන ගැඹුරු අගාධය යි. යුරෝපීය පාර්ලිමේන්තුව හා ජාතික ව්‍යවස්ථාදායකයන් අරක්ගත් එකදු පක්ෂයකට හෝ සැලකිය යුතු සමාජ පදනමක් නැත. ඊනියා 'මහ ජනතාවගේ පක්ෂ' නිලධාරි තන්ත්‍රයෙන් හා ක්‍රියාකාරීන්ගෙන් සැදුම්ලත් ඇටසැකිලිවලට වැඩි යමක් නොවේ. ඔවුහු පෙනී සිටිනුයේ සෞභාග්‍යයන්, ආදායම් හා ජීවන තත්වයන්, ජනගහනයේ අවශේෂ කොටස්වලට වඩා පිම්මේ ඉහල නංවාගත් තුනී තට්ටුවක් වන ආර්ථික ප්‍රභූ පෙලැන්තියේ උවමනාවන් වෙනුවෙනි. ඔවුහු සමාජවාදීන්, සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්, හරිතයින්, ලිබරල්වාදීන් හා ගතානුගතිකවාදීන් ලෙස තමන්ව හඳුන්වා ගත්තද ඔවුන්ගේ ප්‍රතිපත්තීන් එකිනෙකින් වෙනස්වන්නේ ඉතාමත් අල්ප වසයෙනි.

කිසිදු සැකයකින් තොරව, මැතිවරන ප්‍රතිඵලවලට ඔවුනගේ ප්‍රතිචාරය වී ඇත්තේ තව දුරටත් දකුනට තල්ලු වීම යි. මැතිවරන පරාජිතයින් වන ශ්රූඩර්, බ්ලෙයාර් හා රෆාරින් පැහැදිලිව ප්‍රකාශ කර සිටියේ ඔවුන් ඡන්ද දායකයින්ට කිසිදු සහනයක් නොදෙන අතර තමන්ගේ අරමුනුවලට එල්බ සිටින බවයි. මැතිවරනයෙන් විරුද්ධ පක්ෂ ශක්තිමත්ව මතු වී ආ පෝලන්තය, ජර්මනිය හා බ්‍රිතාන්‍යයේ දී ඔවුන් අවධාරනය කලේ ද මීටත් වඩා වේගවත් ව එම අරමුන

ම ක්‍රියාත්මක කරන බවයි.

තමන්ගේම වාසිය සඳහා යුරෝපීය සංගමයට එරෙහිව තිබෙන අතෘප්තිය යොදාගැනීම සඳහා ඇතැම් රටවල සමාජ සෝෂාබද්දන් ලෙස කටයුතු කල අන්ත දක්ෂිනාංශික පක්ෂ, සමස්ථ දේශපාලන ක්‍රියාවලියම තවදුරටත් දකුනට තල්ලු කිරීමේ කාර්යයේ නියැලී සිටිති.

ඔවුන්ට පිටුපසින් සිටිනුයේ පාලක ප්‍රභූවේ බලපෑමක් කල හැකි කොටසක් සහ නිරන්තරයෙන් ම ඉතා ධනවත් පුද්ගලයන් ය. තම ඡන්ද දායකයින්ගේ සමාජ අවශ්‍යතාවන් සපුරා ලීමට අසමත් නිසා නීතියක් ලෙසම ඔවුහු අතිශයින්ම අස්ථාවර බව සනාථ කරයි. උදාහරනයක් ලෙස නෙදර්ලන්තයේ පිම් ෆොටින් ලිස්ට් 2002 දී සිය පුදුම සහගත ජයග්‍රහනයෙන් ඉක්බිති වේගයෙන් බිඳී විසිර ගියේ ය. එසේම ඔස්ට්‍රියාවේ ජෝර්ජ් හයිඩර්ගේ නිදහස් පක්ෂය පසු ගිය යුරෝපීය මැතිවරනයේ ඡන්ද ප්‍රමානයෙන් 3/4ක් අහිමි කර ගත්තේ ය. කෙසේ වෙතත් මෙම පක්ෂ දෙකම සුභ සාධක රාජ්‍යයට එරෙහි දරුනු ප්‍රහාරයක් සමග බැඳුනු පිලිගත හැකි නීතිය හා පිලිවෙල සඳහා වූ දේශපාලනයක් සමග විදේශිකයන් පිලිකෙව් කිරීමේ පිලිවෙත් එකට යා කිරීම අතින් සාර්ථක වී ඇත. සංස්ථාපිත පක්ෂවලට මෙම අන්ත දක්ෂිනාංශික සංවිධානවල පිලිවෙත්වලට බොහෝ දුරට අනුගත වීමට සිදු වී ඇත.

යුරෝපීය මැතිවරනයෙන් සැලකිය යුතු ඡන්ද ප්‍රමානයක් දිනාගත් බ්‍රිතාන්‍යයේ එක්සත් රාජධානි නිදහස් පක්ෂය, බෙල්ජියමේ ව්ලාම්ස් බ්ලොක්, ප්‍රන්සයේ ජාතික පෙරමුන සහ පෝලන්තයේ අන්ත ජාතිකවාදී පක්ෂ වැනි ඒවා එවැනිම ජවනිකාවක් රඟ දක්වති. ඔවුන්ගේ ජයග්‍රහනය නිල කම්කරු සංවිධානවල පාරාජිකාවීම නිසා සමාජය තුල ඇතිව තිබෙන දරුනු දේශපාලන පරිහානියේ ප්‍රකාශනයකි. මෙමගින් පෙන්නුම් කරනුයේ දේශපාලන මූලිකත්වය ගැනීමට කම්කරු පන්තිය අසමත් වුවහොත් ඔවුනට මුහුනපෑමට සිදුවන අන්තරාය යි.

බහුතර ජනතාව හා නිල දේශපාලනය අතර ඇති වී තිබෙන ගැඹුරු අගාධයෙහි අර්ථය වන්නේ යුරෝපය දරුනු පන්ති සටන්වලට අවතීර්නවෙමින් සිටින බවයි. තියුනු සමාජ පරස්පර විරෝධයන් පැත්තෙන් බැලු කල මෙවැනි අරගල සම්පූර්නයෙන්ම නොවැලැක්විය හැකි ය.

දෙවැනි ලෝක සංග්‍රාමයේ පටන් සමාජ සහායන් සැලසීම මගින් හා ප්‍රතිසංස්කරනවාදී සංවිධානවල ආධාර ඇතිව පන්ති ප්‍රතිරෝධයන් සමනය කිරීමට හෝ වැලැක්වීමට පාලක ප්‍රභූ පෙලැන්තිය පියවර ගත්තේ ය. සම්ප්‍රදායික ආන්ඩුවක් එහි ප්‍රතිපත්තීන්ට එල්ල වන ප්‍රතිරෝධය නිසා අසාර්ථක වුව හොත්, සමස්ථ දේශපාලන සංස්ථාපිතයම ප්‍රශ්නයට බඳුන්වීම වැලැක්වීමට සමාජප්‍රජාතන්ත්‍රවාදීහු අඩුව පිරිමැසීමට පැනගත්හ. නැතහොත් වෙනත් දෙයක් ගෙන ආහ. නැගෙනහිර යුරෝපයේ පාලක නිලධාරී තන්ත්‍රය කම්කරු පන්තියේ සෑම ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක්ම මැඩ පැවැත්වූහ.

යුරෝපීය මැතිවරනයෙන් ඉහල තැනකට පමුනුවා තිබෙන ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ බිඳ වැටීම, සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ පිරිහීම සහ පාර්ලිමේන්තු ආයතනවල මෙන්ම පක්ෂවල ආධිපත්‍යය හීන වීමෙහි අර්ථය වන්නේ මෙම යාන්ත්‍රනයන්ගේ බෙලෙහීනත්වය එන්ට එන්ටම වැඩි වන බවයි. මෙලෙස ධනවාදී පාලනය දරුනුම අර්බුදයක ගිලී ඇත.

තරමක් දුර දක්නා නිරීක්ෂකයින් මෙය අවබෝධ කරගෙන තිබේ. ජර්මනියේ පාලක සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ මැතිවරන පරාජය හුදෙක් එස්පීඩීයේ අර්බුදයක් පමනක් නොව ''සන්දීය සමූහාන්ඩුවේම නීත්‍යානුකූලභාවය පිලිබඳ වැඩෙන අර්බුදයක්'' යැයි සතිපතා පුවත්පත වන *ඩී සෙයිට්* සලකන්නේ ය. පුවත්පතට අනුව ඡන්ද දායකයින්ගේ අතෘප්තිය ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදින් නායකත්වය දරන ආන්ඩුව දෙසටත් එල්ල වනු ඇත. රට ''පාලනය කල නොහැකි'' තත්වයට ඇද වැටෙනු ඇත.

රාජ්‍ය යන්ත්‍රනය ක්‍රමානුකූලව ගොඩනගා ගැනීම මගින් මෙවැනි අර්බුදයකට මුහුන දීමට ධනපති පන්තිය සැරසෙමින් සිටිති. අන්තර් යුරෝපීය ආතතීන්ගේ වර්ධනය තිබියදී ම, ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් කප්පාදු කිරීමත් අන්තර් ජාතික පොලිස් රාජ්‍ය ව්‍යුහයන් ගොඩ නැගීමත් යුරෝපීය සංගමය තුල නොකඩවා සීඝ්‍රයෙන් සිදුවෙයි. ආගමනයන් පාලනය කිරීමේ නාමයෙන් 'ඕර්වෙල්ගේ 1984' ලැජ්ජාවට පත් කරමින් මහ ජනයා නිරීක්ෂනය කල හැකි උපකරන වර්ධනය කෙරෙමින් පවතී. ''ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීමේ '' නාමයෙන් අති මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් අහෝසි කෙරේ. ප්‍රධාන කොටම : ත්‍රස්තවාදී සැකකරුවන්ට හා විදේශිකයින්ට එරෙහිව අද දින එල්ල වන ප්‍රහාරයන් අවශ්‍යවූ විටෙක හෙට දිනයේ දී විරුද්ධවාදී ප්‍රවනතාවන් මැඩ පැවැත්වීම සඳහා භාවිතා වනු ඇත.

ප්‍රතිසංස්කරනවාදී සංවිධානවල අබ්බගාත බලපෑමෙන් මෙන්ම සමාජ ප්‍රජාතන්ත්‍රවාදයෙන් සංවිධානාත්මකව පමනක් නොව දේශපාලනිකවත් සම්පූර්නයෙන් ම වෙන්වී ගනිමින් කම්කරු පන්තිය ඉදිරියේ එන අනිවාර්ය පන්ති සටන් සඳහා තම සූදානම ඇති කර ගත යුතු ය. ඡන්දයේ දී සංස්ථාපිත පක්ෂ ප්‍රතික්ෂේප කර ඒවාට දඬුවම් දීම මගින් පමනක් සෑහීමකට පත් විය නො හැක. කම්කරු පන්තිය සමාජ ප්‍රතිසංස්කරනවාදයේ අභාවයෙන් පාඩම් උකහා ගෙන ජාත්‍යන්තර සමාජවාදී ඉදිරිදර්ශනයකට හැරී ගත යුතු ය. එයට ස්වාධීන දේශපාලන බලවේගයක් ලෙස සමාජ ප්‍රගමනයට දායක විය හැක්කේ එලෙස පමනි.

බ්‍රිතාන්‍යයේ සිය සහෝදර සමාජවාදී සමානතා පක්ෂය සමග එක පෙලට සිට ගනිමින් හතරවන ජාත්‍යන්තරයේ ජර්මානු ශාඛාව වන ජර්මානු සමාජවාදී සමානතා පක්ෂය පීඑස්ජිය මැතිවරනයට ඉදිරිපත්වීමේ

පදනම වූයේ මෙයයි.

එදා මෙදා තුර, යුරෝපීය මැතිවරනයේ දී ලබාගත් හොඳම ප්‍රතිඵලය පීඑස්ජීය ලබා ගත්තේ ය. පක්ෂයේ ජාතික ලැයිස්තුවට ඡන්ද 25,824ක් ලැබුනි. ගනිතමය ආකාරයකට සලකා බලතොත් මෙය එතරම් දෙයක් නොවේ. එහෙත් යුරෝපයේ අනාගත සංවර්ධනය යුරෝපීය පාර්ලිමේන්තුවේ ආසන බෙදී යන ආකාරය මත තීන්දු නොවනු ඇත. එය තීන්දු වනු ඇත්තේ ආත්ම විශ්වාසයෙන් යුතුව කෙරෙන කම්කරු පන්තියේ දේශපාලන වැඩ කටයුතුවලිනි. එම අර්ථයෙන් - එනම් කම්කරු පන්තියේ දේශපාලන සංවර්ධනයේ - පාර්ශ්වයෙන් පීඑස්ජීයේ ඡන්ද ඉහල යාම තීරනාත්මක ය.

## යුරෝපීය එක්සත් සමාජවාදී ජනපදය

පීඑස්ජීයේ මැතිවරන වැඩ පිලිවෙලේ හරි මැද පැවතියේ යුරෝපීය එක්සත් සමාජවාදී ජනපදයක ඉදිරි දර්ශනයයි.

පීඑස්ජීයේ මැතිවරන ප්‍රකාශනය පවසන පරිදි ''යුරෝපීය දේශසීමා ඉක්මවා යමින් මහාද්වීපයේ ඇති දැවැන්ත තාක්ෂනික සහ සංස්කෘතික සම්පත් මෙන් ම ද්‍රව්‍යමය සම්පත් ඒකාබද්ධව යොදා ගැනීම මගින් කෙටි කලකින් යුරෝපය තුල ජීවන තත්වයන් ඉහල නැංවීම සඳහා ඉඩකඩ සකසමින් දුගීභාවයෙන් හා පසුගාමීත්වයෙන් මිදීම සඳහා පූර්ව කොන්දේසි නිර්මානය කෙරෙනු ඇත.'' කෙසේ වෙතත් එක්සත් වීමේ ක්‍රියාවලිය මහා ව්‍යාපාරිකයන්ගේ ලාභ අවශ්‍යතාවන්ගෙන් තීන්දු වන තාක් දුරට මෙම කාර්යය අපහසු වනු ඇත.... යුරෝපයේ ප්‍රගතිශීලී එක්සත් වීමක් සිදු වනු ඇත්තේ එක්සත් යුරෝපීය සමාජවාදී ජනපදයක රූපයෙන් පමනකි. මෙය කල්තියාම ඉල්ලා සිටිනුයේ යුරෝපීය කම්කරු පන්තියේ දේශපාලනික ඒකාබද්ධතාවය යි.

එලැඹෙන දේශපාලනික වර්ධනයන්හි දී මෙම ඉදිරි දර්ශනය ඉමහත් වැදගත් කමක් දරනු ඇත. මෙම මැතිවරනයේ දී පැහැදිලිව ප්‍රකාශිත වූ යුරෝපීය ආන්ඩුවලට හා ඒවායේ සමාජ විරෝධී හා ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රතිපත්තීන්ට එරෙහි පුලුල් විරෝධය, ප්‍රගතිශීලී දිශාවකට වර්ධනය කල හැකි වනුයේ මෙවැනි පදනමක පමනි.

යුරෝපීය කම්කරු පන්තිය සමාජවාදී පදනමක එක්සත් කිරීම යනුවෙන් අදහස් කරනුයේ කොතෙක් වැදගත් වූවත් එක්ව පෙලපාලි ඇක්වීම මෙන්ම වැදගත් කම්කරු ප්‍රශ්නවලදී ජාත්‍යන්තර සහෝදරත්වය ගොඩනගා ගැනීම යන්නට වැඩි දෙයකි. ඒ පසු ගිය ශතවර්ෂයේ වැගත් පාඩම් හා අත්දැකීම් මත රඳා පවතින්නා වූ දේශපාලන යොමුවකි. එම ශතවර්ෂය මහා සංග්‍රාමයන් හා විප්ලවයන්ගෙන් පමනක් නොව දැවැන්ත පරාජයන්ගෙන් හා බෙදවාචකයන්ගෙන් සමන්විත විය.

යුරෝපයේ ඓතිහාසික ප්‍රශ්නය සමන්විත වනුයේ මහාද්වීපය තරගකාරී ජාතික රාජ්‍යයන්ට බෙදී යෑම මගින් ඉහලම මට්ටමකට වර්ධනය වී තිබෙන නිෂ්පාදන බලවේග මත පටවා තිබෙන සීමා කිරීම් ඔරොත්තු නොදීම යන කාරනයෙනි. ධනපති සබඳතාවල පදනම මත යුරෝපය එක්සත් කිරීම සහ මෙම ප්‍රශ්නය ප්‍රගතිශීලී ආකාරයකට විසඳීම කල නො හැකි ය. ලෝක මහා සංග්‍රාමයන් දෙකකට හේතු වූයේ මෙයයි.

සංග්‍රාමයන් දෙකම ඇතිවූයේ යුරෝපය සිය අධිකාරය යටතට ගැනීමේදී මෙම බෙදීම් බලය යොදා ජය ගැනීම සඳහා ජර්මන් අධිරාජ්‍යවාදය දැරූ උත්සාහයෙනි. අවස්ථා දෙකේ දී ම මෙම උත්සාහයන් කෙලවර වූයේ විනාශයන්ගෙන් ය.

දෙවැනි ලෝක සංග්‍රාමයෙන් පසු, මෙම ඓතිහාසික ප්‍රශ්නයෙන් ගොඩ ආ බවක් පෙනෙන්නට තිබුනි. අවසාන විග්‍රහයේ දී, යුරෝපීය සංගමයක් තුල ඒකාග්‍ර වීමේ ක්‍රියාවලිය, යුරෝපීය බලයන් අතර සාමකාමී සබඳතා වර්ධනය වීම හා සමාජ සහනාධාර තුලින් පන්ති අරගලය සමහන් කිරීමේ හැකියාව, යුරෝපය සාමදාන කිරීම සඳහා සිය දැවැන්ත ආර්ථික සම්පත් භාවිතා කල ඇමරිකාව සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම මත සිදු වුනි. මෙය යලිදු වතාවක් සෝවියට් සංගමය සමග ගැටුමේ පොදු ප්‍රතිපත්තිය නිසා සිදු විය. සීතල යුද්ධ සමයේ දී, බටහිර යුරෝපය, ඇමරිකාවේ අත්හල නොහැකි මූලෝපායාත්මක පවුරක් ලෙස තිබුනි.

සෝවියට් සංගමය බිඳ වැටුනු තැන් පටන්, අධිරාජ්‍යවාදී බලය අතර පරස්පර විරෝධයන් නැවතත් කරලියට පැමින ඇත. පලමු ඉරාක යුද්ධය, යුගෝස්ලෝවියාවට එරෙහි යුද්ධය සහ දැන් නැවතත් දෙවැනි ඉරාක යුද්ධය මගින් නැවත නැවතත් පැහැදිලි වනුයේ යුරෝපීය සහ ඇමරිකානු අධිරාජ්‍යවාදීන්ගේ නො සන්සිඳෙන දිගු කාලීන ආර්ථික හා මූලෝපායාත්මක උවමනාවන් ය.

ඇමරිකාව සමග ඇති ආතති සහගත තත්වය ද යුරෝපයේ පරස්පර විරෝධයන් එලිමහනට ගෙන එයි: ඉරාකයේ මිලිටරිමය යටත් කිරීම මගින් සිය ලෝකාධිපත්‍යය ආරක්ෂා කර ගැනීමට ඇමරිකානු අධිරාජ්‍යවාදීන් දරන උත්සාහය නිසා ඉරාක යුද්ධය හා යුරෝපීය ව්‍යවස්ථාව පිලිබඳ ගැටුම් මත යුරෝපයේ අභ්‍යන්තර සමතුලිතතාවයේ අත්තිවාරම් සසල කරනු ලැබ ඇත.

ඊනියා ''යුරෝපීය 'ඒකාග්‍ර වීමේ ක්‍රියාවලිය' වඩවඩාත් එක් ප්‍රශ්නයක් වටා භ්‍රමනය වේ. එනම් කුමන සුපිරි බලවේගය හෝ ධනපති කන්ඩායම යුරෝපීය සංගමය පාලනය කරන්නේ ද? යන්නයි. යුරෝපීය මැතිවරනය මත් මෙම වර්ධනය වඩා වේගවත් කලේ ය.

මැතිවරන ප්‍රතිඵලයේ සාමාන්‍ය දකුනට පැද්දීම කෙරෙහි සංස්ථාපිත පක්ෂ දැක්වූ ප්‍රතිචාරය මගින් ජාතිවාදී හා ස්වෝත්තමවාදී බලවේග තව දුරටත් උනන්දු කරවනු ඇත.

අවසානයේ දී නිෂ්පාදනයේ භූගෝලීයකරනය මගින්

සමාජ සම්මුතියේ පිලිවෙත්වලට වල කපා ඇත. ඇතැම්විට, මීට පෙරාතුව, යුරෝපීය සංගමය තුල සමාජ හා ප්‍රාදේශීය වෙනස්කම් පාලනය යම් තරමකට තුලනය කර ගත හැකි වූ මුත් දැන් බ්‍රසල්හි යුරෝපීය කොමිසම පුද්ගලීකරනය කම්කරු අයිතීන් කප්පාදුවේ සංකේතයන් බවට පත්ව ඇත.

මෙම මූලධර්මාත්මක ජාත්‍යන්තර වෙනස්කම් දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව තිබූ ප්‍රතිසංස්කරනවාදී දේශපාලනය කරා නැවතත් යාම අසීරු කර ඇත. 1970 ගනන්වල පැවතියාක් මෙන් ''සමාජ ප්‍රතිසංස්කරන ප්‍රතිපත්තිය අදටත් යොදා ගත හැකි යැයි'' යමෙකු කියන්නේ නම් ඔහු කරන්නේ වැඩ කරන ජනතාවගේ ඇස් මත පුලුන් තැබීමකි. සියලු ප්‍රතිසංස්කරනවාදී එකඟතාවන්ට වඩා ධනවාදයේ වෛෂයික පරස්පර විරෝධයන් බලගතු බව සනාථ කර තිබේ. පශ්චාත් යුද කාලීන චාන්සලර් විලී බ්‍රාන්ට්ගේ සමාජප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (එස්පීඩී) යලි පන දීමේ යෝජනා, ස්ටැලින්වාදී ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී සමූහාන්ඩුවට යලි පන පෙවීමේ ප්‍රත්‍යක්ෂ ඖෂධයන්ට වඩා වැඩියෙන් යථාර්ථවාදී හෝ හොඳ වන්නේ නැත. මෙවැනි ප්‍රතිගාමී ආස්ථානයන්ගෙන් මුලාවේ වැටීමට කම්කරු පන්තිය තව දුරටත් ඉඩ නොදිය යුතු ය.

කම්කරු ජනයාට තම සමාජීය හා ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ආරක්ෂා කර ගත හැක්කේ ජාතික දේශසීමා ඉක්මවා යමින් එය ඒකාබද්ධතාවය පිහිටුවා ගැනීමෙන් හා යුරෝපීය ආර්ථිකය සමාජවාදී ආකාරයකට ප්‍රතිසංවිධානය කිරීම මගින් පමනි. යුරෝපීය සංගමයට හා යුරෝපීය ආන්ඩුවලට එරෙහිව වර්ධනය වන ප්‍රතිරෝධයට නිවැරදි මානයක් අත්කර දිය හැක්කේ යුරෝපීය එක්සත් සමාජවාදී ජනපදයක ඉදිරිදර්ශනයක් හරහා පමනි. යුරෝපීය පාලක ප්‍රභූවේ සමාජවිරෝධී හා වගකීම් විරහිත ප්‍රතිපත්තීන් පරාජය කොට හාම්පුතුන්ගේ ලාභ සූරා කෑමේ උවමනාවන්ට ඉහලින් මහජනයාගේ උවමනාවන් පිහිටුවන සමාජයක් ගොඩ නැගිය හැක්කේ මෙම පදනම මත පමනි.■

© www.wsws.org